(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 37.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2023 ජූලි 01 සෙනසුරාදා පූ.භා. 9.30 ට**

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2023 පෙබරවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 7.30 දක්වා විය යුතු ය. අ.භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2023 ජූලි 05 බදාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ස්වෛරීත්ව ණය තිරසරභාවය නැවත ඇති කිරීමට දේශීය ණය ප්‍රශස්තකරණය ක්‍රියාත්මක කිරීම සඳහා වන යෝජනා සම්මතය,— 2023 ජූනි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ජනරජයේ දේශීය ණය තිරසරභාවය තහවුරු කිරීමටත්, ශ්‍රී ලංකාවේ මහජනතාව සහ අනාගත පරපුර ප්‍රතිලාභ ලබන තිරසර ආර්ථික වර්ධනය පෙරදැරි කරගත් ආර්ථික ප්‍රකෘතිමත්භාවය වෙත වන වේගවත් සංක්‍රමණය තහවුරු කිරීම සඳහාත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශීය ණය ප්‍රශස්තකරණය සඳහා අවශ්‍ය සියලුම අවසර මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට ලබාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2023 ජූනි 28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සහ එහි තීරණය; ස්වෛරීත්ව ණය තිරසරභාවය නැවත ඇති කිරීමට දේශීය ණය ප්‍රශස්තකරණය ක්‍රියාත්මක කිරීම සඳහා වූ සංකල්ප පත්‍රිකාව; සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ වන රෙගුලාසි අද දින (2023 ජූලි 01) පාර්ලිමේන්තුවට පිළිගන්වා සභා මේසය මත තබා ඇත.)

*2.

දූෂණ විරෝධී පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2023 ජූනි 21) [1]

*3.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2023 ජූනි 21) [1]

*4.

ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ශ්‍රී ලංකා මහ බැංකු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

බැංකු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ගුවන් ප්‍රවාහන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— උදර්පණ පනත යටතේ නියමය,— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ 2 වගන්තිය යටතේ නාමෝද්දිෂ්ට පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 පෙබරවාරි 14 දිනැති අංක 2319/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 13, 14, 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 20 දිනැති අංක 2324/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.06.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*14.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත යටතේ නියෝග,— 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 3(5) වගන්තිය සමඟ කියවිය යුතු 10 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූලි 07 දිනැති අංක 2287/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව (2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.02.09 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.03.21 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.02.22 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*22.

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2019),— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩල පනත යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*23.

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2020),— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩල පනත යටතේ 2023.02.22 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*24.

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020/2021),— 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ පනත යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද, 2021.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ 2020/2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

25.

ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

26.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

27.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

නැගිටිමු නැගෙනහිර සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

සමාධි සෞඛ්‍ය සේවා, පාරිසරික, කෘෂිකාර්මික, සංස්කෘතික හා ක්‍රීඩා මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

සහන ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.

සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.

රුහුණු උදානය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.

"මාතර සමය" සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

46.

විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

47.

මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

48.

දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

49.

ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

50.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

51.

විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

52.

වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

53.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

54.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

55.

හදට හද භාරකාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---